ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2022-10-18

පැමිණිලි පාර්ශවය : සුදත් සමන්තිලක ලියන ගුණවර්ධන මයා,
K/G/3, ඇල්විටිගල මහල් නිවාස,
කොළඹ 08.

වගඋත්තර පාර්ශවය : 01. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. විදුහල්පති,
රාජකීය විද්‍යාලය,
කොළඹ 07.

<u>පැමිණිලි අංකය : **HRC/819/17**</u>

ඉහත පැමිණිලිකරු ඇතුළු පැමිණිලිකරුවන් තිදෙනෙකු විසින් 2017.03.02 දාතමින් පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, තමන් කොළඹ රාජකීය විද්‍යාලයේ සේවය කරමින් සිටියදී ඉහත වගඋත්තරකරුවන් විසින් තමන් නීතිවිරෝධී ලෙස ස්ථාන මාරුකිරීම මගින් තම මූලික අයිතිවාසිකම් කඩ වී ඇති බවයි. ඉහත දින මුල් පැමිණිල්ල ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පැමිණිලිකරුවන් විසින් පැමිණිල්ලට අදාළව වැඩිදුර කරුණු දැක්වීම් ද ඉදිරිපත් කර ඇත. ඒ අනුව පැමිණිලිකරුවන් මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත්තේ, තම ස්ථාන මාරුව අවලංගු කර තමන්ට කොළඹ රාජකීය විද්‍යාලයේ නැවත සේවය කිරීමට අවස්ථාව සලසා දෙන ලෙස වගඋත්තර පාර්ශවය වෙත නිර්දේශ කරන ලෙසයි.

**වගඋත්තර පාර්ශවයේ කරුණු සැළකිරීම :-**

<u>01 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම</u>

මේ සම්බන්ධයෙන් 2017.07.13 දිනැතිව වාර්තාවක් ඉදිරිපත් කරමින් ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දන්වා ඇත්තේ, මෙම ස්ථාන මාරුවීම් සිදුකර ඇත්තේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர்: 011-2505451
ෆැක්ස් / தொலைநகல்: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல்: sechrcsl@gmail.com

අධ්‍යාපන සේවා කමිටුවේ අනුමැතිය පරිදි බවත්, මෙම පැමිණිලිකාරිය ඒ වන විට රාජකීය විද්‍යාලය තුළ රාජකාරී සිදුකිරීම මඟින් පාසල තුළ විවිධ අර්බුද හටගැනීමට හැකියාව පවතින බැවින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව මෙම ස්ථාන මාරුවීම් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිදුකර ඇති බවත්, ඒ අනුව තමා මෙහිදී නීතියට පටහැනිව කටයුතු කර නොමැති බවත්ය.

තවද මෙම පැමිණිල්ලේ එක් පාර්ශවකරුවෙකු වන අනුර වනිගසිංහ මහතා SCFR 95/2017 යටතේ මෙම පැමිණිල්ලේ විෂයගත කාරණයට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කර ඇති බව සහ එම පෙත්සම විභාගයට ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණය අවසර ලබා දී ඇති බවද අදාළ ලිඛිත කරුණු දැක්වීම මඟින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

**විමර්ශනය :-**

පැමිණිල්ලට අදාළව සිදුකරන ලද පරීක්ෂණයේදී ඉදිරිපත් වී ඇති කරුණු අනුව ඒ වන විටත් පැමිණිල්ලේ පාර්ශවකරුවන් අතරින් අනුර වනිගසිංහ යන අය ශ්‍රේෂ්ඨාධිකරණය වෙත මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කර එම පෙත්සම විභාගයට ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණය අවසර ලබාදී ඇති තත්වය තුළ පැමිණිලි පාර්ශවයට යම් සහනයක් ලබා දී පැමිණිල්ල සමථයට එළඹීමට ඇති හැකියාව පිළිබඳව වගඋත්තරකාර පාර්ශවය වෙත යෝජනා කර ඇති අතර, ඒ සඳහා ඔවුන් ඊට තම එකඟතාවය පළකර නැත.

ඒ අනුව මෙම පැමිණිල්ලේ ප්‍රශ්නගත කාරණය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත එක් පාර්ශවකරුවෙකු පෙත්සමක් ඉදිරිපත් කර ඇති බැවින් සහ එම පෙත්සම විභාගයට ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණය අවසර ලබා දී ඇති බැවින් එම තත්වය මත ඉදිරි විමර්ශන කටයුතු අත්හිටුවා ගොනුව බහා තැබීමට කොමිෂන් සභාව කටයුතු කර ඇත. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුව අවසන් වීමෙන් පසුව නැවත විමර්ශනය ආරම්භ කර ඇත.

ඒ අනුව අනුර වනිගසිංහ මහතා විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කර තිබූ මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාගයේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් සහ පෙත්සම්කාර පාර්ශවය ඇතිකරගෙන ඇති සමථය/ එළඹී එකඟතාවය අනුව නඩුව අවසන් වී ඇති බව නිරීක්ෂණය වේ. අදාළ එකඟතාවය වී ඇත්තේ පැමිණිලිකරු වෙත ලබා දී ඇති ස්ථාන මාරුව සේවා අවශ්‍යතාවය මත ලබාදී ඇති ස්ථාන මාරුවක් බවට වසර ඇතුළත අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් නැවත වනිගසිංහ මහතා වෙත ලිපිය සකස් කළයුතු බවයි. ඒ අනුව 2018.11.19 දිනැතිව ජාතික පාසල් ගුරු ස්ථාන මාරු අධ්‍යක්ෂ පී.එන් අයිලප්පෙරුම මහතා විසින් අනුර වනිසිංහ මහතා වෙත අදාළ ස්ථාන මාරු ලිපිය නිකුත් කර ඇති බව නිරීක්ෂණය වේ. එම ලිපියේ අවසාන වශයෙන් සඳහන් කර ඇත්තේ 'තවද ඔබ වෙත 2017.02.03

දිනැතිව නිකුත් කරන ලද ස්ථාන මාරුව සේවා අවශ්‍යතාවය මත සිදුකරන ලද්දක් බව සනාථ කරමි' යන්නය.

ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේදී දෙපාර්ශවය අතර ප්‍රශ්නගත කාරණය සම්බන්ධයෙන් සමථයකට/එකඟතාවකට පැමිණ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුර වනිගසිංහ මහතා සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකර තිබෙන බව ඉහත ලිපිය ඔහු වෙත යොමුකර තිබීම මගින් තහවුරු වේ.

කෙසේ වෙතත්, මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ල ඉදිරිපත් කර ඇති අනෙක් පැමිණිලිකරුවන් දෙදෙනා ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවේ පාර්ශවකරුවන් වී නොමැති බැවින් ඔවුන් සම්බන්ධයෙන් නඩු විභාගයේදී හෝ සමථයකට එළඹීමේදී සාකච්ඡා කර ඇති බව හෝ අවධානය යොමු වී නොමැති බව නිරීක්ෂණය වේ. කෙසේ වෙතත් වජිරා රණසිංහ නැමැති පැමිණිලිකාරිය මේ වන විට මියගොස් ඇති බව අනාවරණය වී ඇති අතර, සුදත් ලියනගුණවර්ධන මහතා වෙනුවෙන් පැමිණිල්ල සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවේ තීරණය ලබා දෙන ලෙස නීතඥ මහේන්ද්‍ර ඩයස් මහතා මගින් ලිඛිත ඉල්ලීම් කර ඇත.

ඒ අනුව පැමිණිල්ලේ වැඩිදුර විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු අනුව මෙම පැමිණිලිකරුවන් තිදෙනා වෙතම ස්ථාන මාරු ලිපි ලබා දී ඇත්තේ සමාන ආකාරයෙන් බව නිරීක්ෂණය වන බැවින් අනුර වනිගසිංහ මහතා සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ ඇතිකරගෙන තිබෙන සමථය මෙම පැමිණිලිකරුවන් සඳහාද අදාළ කරගත හැකි බව පෙනී යයි. ඒ අනුව මෙම පැමිණිලිකරුවන් දෙදෙනාට ලබාදී ඇති ස්ථාන මාරුවීම්ද සේවා අවශ්‍යතාවය මත ලබාදී ඇති ස්ථාන මාරුවීම් ලෙස නැවත ස්ථාන මාරුවීම් ලිපියක් ලබාදිය යුතු බව කොමිෂන් සභාවේ නිරීක්ෂණයයි.

**නිගමනය/නිර්දේශය :-**

මේ අනුව පැමිණිල්ල සම්බන්ධව සිදුකර ඇති වැඩිදුර විමර්ශනයේදී පාර්ශවකරුවන් ඉදිරිපත් කර ඇති ලිඛිත සහ වාචික සැළකිරීම් අනුව මෙම පැමිණිල්ලේ ප්‍රශ්නගත කාරණය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ ඇතිකරගෙන ඇති සමථයෙන් ඔබ්බට නිර්දේශයක් මානව හිමිකම් කොමිෂන් සභාව වෙතින් ලබාදීම සුදුසු නොවන බව නිරීක්ෂණය වන බැවින් සුදත් ලියන ගුණවර්ධන මහතා හට අනුර වනිගසිංහ මහතා සම්බන්ධයෙන් ලබා දී ඇති ස්ථාන මාරු ලිපියට සමාන 'සේවා අවශ්‍යතාවය මත' බවට සඳහන් ස්ථාන මාරු ලිපියක් ලබාදිය යුතු බවට ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මෙයින් මෙයින් දන්වා සිටිනු ලැබේ.

2022. 11 . 24 දිනට පෙර ඉහත පරිදි කටයුතු කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම ඉහත දැනුම්දීම ප්‍රකාරව ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපතිනී,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

මා.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

B/h